සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

දෙවන වාර ඇගයීම

**- 2018**

**Second Term Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 8 | විෂයය / பாடம் / Subject: කතෝලික ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: 1,2 | පැය / மணித்தியாலம் / Hours: 02 |

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න**
- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න**

1/ ජේසුස් වහන්සේ අන්තිම රාත්‍රී භෝජනය අවස්ථාවේ දී ස්ථාපිත කළ ප්‍රසාද නිධාන වන්නේ
1 . රෝගීන්ගේ ආලේපය හා පූජකවරය 2. පූජකවරය හා අභිවෘද්ධි ආලේපය
3. දිව්‍ය සත්ප්‍රසාදය හා පූජකවරය 4. දිව්‍ය සත්ප්‍රසාදය හා රෝගීන්ගේ ආලේපය

2/ කතෝලික ජනවන්දනාවේ කේන්ද්‍රස්ථානය කුමක්ද
1. ප්‍රසාද නිධාන 2. සමගි සන්ධානය 3. දිව්‍ය පූජාව 4. දස පනත

3/ මරණීය පාපයක් කර ඇත්නම් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීමට පෙර ..................කර ගත යුතුය. හිස්තැන සම්පූර්ණ කරන්න.
1. දිව්‍ය සත්ප්‍රසාදය 2. රෝගීන්ගේ ආලේපය 3. පාපොච්චාරණය 4. ආශීර්වාදකාර බන්ධනය

4/ මේවායින් ශුද්ධාත්ම ඵල පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
1. ස්නේහය ,ප්‍රීතිය, යහපත්කම 2. විශ්වාසවන්තකම, කරුණාව, තේරුම්ගැනීම
3. ඉවසීම, දේව භක්තිය , පිරිසිදුකම, 4. ප්‍රඥාව, තේරුම් ගැනීම ප්‍රීතිය

5/ “ මා මෙය දැන ගන්නේ කෙසේද? මම මහල්ලෙක්මි. මාගේ භාර්යාව ද වයස්ගතව සිටී. “ මෙය කාගේ කියමනක්ද?
1. එළිසබෙත් තුමියගේ 2. ස්නාවක ජොහන් තුමාගේ 3. ආබ්‍රහම් තුමාගේ 4. සකරියස් තුමාගේ

6/ ජේසුස් වහන්සේගේ ළමා විය පිළිබඳව කරුණු ඉදිරිපත් කරන ශුභාරංචි කතුවරු දෙදෙනා වන්නේ
1. ශුද්ධ වූ ජොහන් තුමා හා ශුද්ධ වූ මතෙව් තුමා 2. ශුද්ධ වූ මාක් තුමා හා ශුද්ධ වූ මතෙව් තුමා
3. ශුද්ධ වූ ලූක් තුමා හා ශුද්ධ වූ මතෙව් තුමා 4. ශුද්ධ වූ ලූක් තුමා හා ශුද්ධ වූ මාක් තුමා

7/ දේව රාජ්‍යය අප තුළට ළඟා කර ගැනීමට නම් අප කළ යුත්තේ
1. අප ළඟ ඇති දේ අන් අය සමග බෙදා ගැනීමය 2. අප සතු සැම දේ පරිත්‍යාග කිරීමට සූදානම් වීමය
3. අපගේ දක්ෂතා අන් අයට පෙන්වීමය 4. අප සතු හැකියාවන් දියුණු කර කර ගැනීමය

8/ මාරුත දමනයේ ප්‍රතිහාර්යයෙන් අපට පෙන්වන්නේ ,
A - ජේසුස් වහන්සේගේ බල පරාක්‍රමයයි B - ජේසුස් වහන්සේ සැබෑ දේව පුත්‍රයාණන් බවයි
C - ජේසුස් වහන්සේගේ සැබෑ ආදරයයි D - ස්වභාව ධර්මය පවා ජේසුස් වහන්සේට කීකරු වන බවයි
මින් වඩාත් නිවැරදි පිළිතුර වන්නේ
1. A හා D ය. 2. A හා C ය. 3. B හා D ය. 4 . A හා B ය.

9/ අපේ ජීවිතවල ප්‍රාතිහාර්ය අත්දැකීමට නම්
1. සියල්ල දෙවියන් වහන්සේට කළ හැකි බව විශ්වාස කළ යුතුය. 2. අපගේ අසල්වැසියන්ට ප්‍රේම කළ යුතුය.
3. සියලු දෙනා සමග නිතර ම යාච්ඤා කළ යුතුය 4. සියල්ලන් සමග සමගියෙන් ජීවත් විය යුතුය.

10/ කාන්තාවන් පිළිබඳව විශේෂාකාරයෙන් සඳහන් කරන සුවිශේෂක කතුවරයා කවුද?
1. ශුද්ධ වූ මාක් තුමා 2. ශුද්ධ වූ ලූක් තුමා 3. ශුද්ධ වූ ජොහන් තුමා 4. ශුද්ධ වූ මතෙව් තුමා

11/ අධෛර්ය නොවී නොකඩවා යාච්ඤාවෙ හි යෙදිය යුතු බව දක්වන උපමාව වන්නේ
1. වපුරන්නාගේ උපමාවයි 2. පරිසිවරයා හා අයකැමියා ගැන උපමාවයි
3. යහපත් සමරිතානුවරයාගේ උපමාවයි 4. වැන්දඹුව හා විනිශ්චය කාරයා ගැන උපමාවයි

12/ "නාඩන්න , ඇය මැරී නැත. ඇය නිදන්නීය. " මෙසේ වදාළේ
1 . ජේසුස් වහන්සේ විසින් ජායිරස්ට 2. ජේසුස් වහන්සේ විසින් පේදුරු තුමාට
3 . පේදුරු තුමා විසින් සමූහයාට 4. ජේසුස් වහන්සේ විසින් ජාකොබ් තුමාට

13/ "නුඹේ ආයු කාලය සම්පූර්ණ වී නුඹේ පියවරුන් සමග සැතපුන කල්හි මම නුඹෙන් පැවත එන නුඹේ ම දරුවෙකු නුඹට පසු රජකමට නංවා ඔහුගේ රාජ්‍යයෙහි ඔහු ස්ථිර කරන්නෙමි. "
ඉහත සඳහන් වචන දාවිත් රජතුමාට දැන් වූ දිවැසිවරයා වන්නේ
1. ආමොස් දිවැසිවරයා 2. නාතාන් දිවැසිවරයා 3. එලියා දිවැසිවරයා 4. එලීෂා දිවැසිවරයා

14/ අභිවෘද්ධි ආලේපනය දේව ප්‍රසාද නිධානය දානය කිරීමේ බාහිර සලකුණ වන්නේ
1. ඥාන මව්පියන්ගේ පොරොන්දුව 2. අපේක්ෂකයාගේ නළල ක්‍රිෂ්මා තෛලයෙන් ආලේප කිරීම
3 . ප්‍රසාද ස්නාපන පොරොන්දු අලුත් කරන අවස්ථාව 3. අපේක්ෂකයින් පොරොන්දු දෙන අවස්ථාව

15/ "මාගේ අසල්වැසියා කවරෙක්ද?" යනුවෙන් විනයධරයෙක් ජේසුස් වහන්සේගෙන් ඇසූ විට එයට පිළිතුරක් වශයෙන් උන්වහන්සේ වදාළ උපමාව වන්නේ
1. යහපත් සමරිතානුවරයාගේ උපමාව 2. මුතු ඇටය ගැන උපමාව
3. වපුරන්නාගේ උපමාව 4. කරුණාවන්ත පියාගේ උපමාව

16/ ජේසුස් වහන්සේ තමන් වහන්සේගේ ප්‍රසිද්ධ ජීවිතය ආරම්භ කළේ
1. ජුදයාවෙනි 2. නාසරෙත් නුවරිනි 3. සමාරියෙනි 4. ගලීලයෙනි

17/ සැබෑ සිත් හැරීමක් අප තුළ ඇති වීමට නම්
A - අවංකව පසුතැවිලි විය යුතුය B - ආත්මාර්ථකාමී බවෙන් ජීවත් විය යුතුය
C - තම දුර්වලකම් හා අඩුපාඩු පිළිගත යුතුය D-පාපයෙන් තොර වී දෙවියන් වහන්සේට ප්‍රසන්නව ජීවත් විය යුතුය
මේ අතුරෙන් වඩාත් නිවැරදි පිළිතුර වන්නේ
1. A හා B නිවැරදිය 2. A හා D පමණක් නිවැරදිය 3. A,C,D නිවැරදිය 4. A, B, C නිවැරදිය

18/ ජේසුස් වහන්සේ අපොස්තුලුවරුන් පිට හුස්ම හෙළා .................. පිළිගන්න. යයි වදාළ සේක. මෙහි හිස්තැන සම්පූර්ණ කරන්න.
1. පුත්‍රයාණන් 2. පියාණන් 3. ශුද්ධාත්මයාණන් 4. සමිදාණන්

19/ යොසායා දිවැසිවරයා සඳහන් කරන ආකාරයට අනුව "පාළුකරයේ මොරගා කියන හඩ" යනුවෙන් අදහස් කරනු ලබන පුද්ගලයා වන්නේ
1. ස්නාවක ජොහන් තුමා ය. 2. පේදුරු තුමා ය. 3. ජාකොබ් තුමා ය. 4. ස්තේපන් තුමා ය

20/ පූප වැඩි කිරීමේ ප්‍රාතිහාර්ය තුළින් ජේසුස් වහන්සේ අන් අයගේ කුස ගින්නේදි ඔවුන් පෝෂණය කිරීමට කටයුතු කළා සේ දිළින්දන් වෙනුවෙන් අපගේ යුතුකම විය යුත්තේ
1. ඔවුන් වෙනුවෙන් යාච්ඤා කිරීම 2. ඔවුන්ට රැකියාවක් ලබා දීමට කටයුතු කිරීම
3 . ඔවුන්ව හැකි පමණින් නගා සිටුවීම 4. අන් අයගේ කුස ගින්නේදි අප සතු දේ බෙදා ගැනීම

8 ශ්‍රේණිය

2 කොටස

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ
- පළමුවන ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න
- පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක් ද ,තෝරා ගන්නා අනිකුත් ප්‍රශ්නයකට ලකුණු 11 ක්ද බැගින් හිමිවේ.

01/ පන්ති කාමරය තුළ ඔබ විසින් සිදු කරන ලද "දේව ප්‍රසාද නිධාන" යන ඇගයීම තුළින් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(1) ආරම්භක දේව ප්‍රසාද නිධාන නම් කරන්න (ලකුණු 03)
(2) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේගේ පූර්ව සළකුණු තුනක් ලියන්න (ලකුණු 03)
(3) ප්‍රසාද ස්නාපනයේ දී අප තුළ ජනිත වූ විශ්වාසය පරිණත වන දේව ප්‍රසාද නිධානය කුමක්ද? (ලකුණු 02)
(4) ශුද්ධාත්ම දීමනා හතරක් නම් කරන්න (ලකුණු 02)
(5) මෙම ඇගයීම සිදු කිරීම සඳහා ඔබ කරුණු සොයා ගත් ආකාර තුනක් ලියන්න. (ලකුණු 03)
(6) මෙම ඇගයීම තුළින් ඔබ ලබා ගත් සතුටුදායක අත්දැකීම් තුනක් ලියන්න. (ලකුණු 03)

02/ (1) පුරාණ ගිවිසුමේ ශුද්ධාත්මයාණන් වහන්සේව හඳුන්වනු ලැබූ නාම දෙකක් ලියන්න (ලකුණු 02)
(2) පෙන්තකොස්ත දින ශුද්ධාත්ම දානයෙන් පසු ගෝලයින් තුළ ඇති වූ වෙනස්කම් තුනක් ලියන්න (ල. 03)
(3) ඔබගේ ජීවිතය තුළ ශුද්ධාත්මයාණන් වහන්සේ අත්දුටු අවස්ථාවක් විස්තර කරන්න (ලකුණු 06)

03/ (1) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීමට ආත්මික සූදානම යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02)
(2) දිව්‍ය සත්ප්‍රසාදයේ ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 03)
(3) දිව්‍ය සත්ප්‍රසාදය තුළ වැඩ සිටින ජීවමාන වූ ජේසුස් වහන්සේ ලබා ගත් ඔබ කරන යහපත් ක්‍රියා තුනක් ලියන්න (ලකුණු 06)

04/ (1) දේව රාජ්‍යය යනු කුමක්දැයි කෙටියෙන් පහදන්න (ලකුණු 02)
(2) දේව රාජ්‍යයේ වටිනාකම් පිළිබඳව ඉගැන්වෙන උපමා තුනක නම් ලියන්න (ලකුණු 03)
(3) ඔබ ලියූ උපමා තුනෙන් ලැබෙන පණිවිඩ දෙක බැගින් ලියන්න (ලකුණු 06)

05/ (1) ජේසුස් වහන්සේගේ දේව පුත්‍රභාවය අනාවරණය වූ අවස්ථාවක් නම් කර එම අවස්ථාවේ ප්‍රකාශ වූ වචන ලියන්න. (ලකුණු 02)
(2) ජේසුස් වහන්සේ මුහුණ දුන් පරීක්ෂා තුන නම් කරන්න (ලකුණු 03)
(3) එදිනෙදා ජීවිතයේදී අපට මුහුණ දීමට සිදුවන පරීක්ෂා ජය ගැනීමට කළ යුතු දේවල් 6ක් ලියන්න (ල. 06)

06/ (1) ස්නාවක ජුවාම් තුමාගේ දෙමව්පියන් නම් කරන්න (ලකුණු 02)
(2) මෙසියස් වහන්සේ පිළිගැනීම පිණිස ස්නාවක ජුවාම් තුමා විවිධ ජන කොටස් වලට දුන් අවවාද වෙන වෙනම ලියන්න (ලකුණු 03)
(3) ස්නාවක ජුවාම් තුමාගේ ජීවිතයෙන් ගත හැකි ආදර්ශ හයක් ලියන්න (ලකුණු 06)

07/ (1) ජේසුස් වහන්සේ සිදු කළ ප්‍රාතිහාර්ය වර්ග දෙකක් ලියන්න (ලකුණු 02)
(2) ජේසුස් වහන්සේ රෝගීන් සුව කළ අවස්ථාවන්ට උදාහරණ තුනක් ලියන්න (ලකුණු 03)
(3) ලෙඩ රෝග වලින් පීඩා විඳින්නන් උදෙසා ඉක්මන් සුවය පතා කිව හැකි යාච්ඤාවක් ලියන්න (ලකුණු 06)